WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**87 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II
தொடர்பாடலும் ஊடகக் கல்வியும் I, II
Communication and Media Studies I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

**1.** 'වීරයා' නවකතාව කියවූ බොහෝදෙනාගේ මතය වූයේ "එහි ළමා චරිත අප කුඩා කාලය වෙත කැඳවාගෙන යන බව" ය. මෙම අත්දැකීමට පදනම් වීමට බොහෝ සෙයින් ඉඩ ඇත්තේ,
(1) කුඩා කණ්ඩායම් සන්නිවේදනයයි. (2) විශාල කණ්ඩායම් සන්නිවේදනයයි.
(3) පුද්ගලාන්තර සන්නිවේදනයයි. (4) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයයි.

**2.** කළුලැල්ලේ සටහන් කළ කලින් පාඩමේ තොරතුරු සම්පූර්ණයෙන් ම මකා දමා නොතිබුණු බැවින් අලුත් පාඩමට අදාළ රූප සටහන පැහැදිලි බවින් තොර විය. මෙය,
(1) අර්ථ බාධකයකි. (2) මාධ්‍ය බාධකයකි.
(3) තාක්ෂණික බාධකයකි. (4) දෘශ්‍ය බාධකයකි.

**3.** ගුවන්විදුලි නිවේදකයෙක් සිය ග්‍රාහකයන් ඇමතිය යුත්තේ,
(1) ඉලක්ක ග්‍රාහකයා සිතින් මවාගනිමිනි. (2) සමාජ විවිධතාවන්ට උචිත වන ලෙසිනි.
(3) මිතුරන් සමඟ කතා කරන ආකාරයෙනි. (4) තනි තනි පුද්ගලයා අමතන අයුරිනි.

**4.** ශ්‍රී ලංකාවේ පළමු පුවත්පත වන්නේ,
(1) ලංකා ලෝකය ය. (2) කලම්බු ජර්නල් ය.
(3) ලක්මිණි පහන ය. (4) ඥානාර්ථ ප්‍රදීපය ය.

**5.** පුවත්පතක ඉඩ වෙන් කිරීමේ දී ප්‍රමුඛතම අවධානය යොමු වන්නේ,
(1) ප්‍රවෘත්ති සම්බන්ධයෙනි. (2) දැන්වීම් පිළිබඳව ය.
(3) කර්තෘ වාක්‍ය ගැන ය. (4) මුල් පිටුව කෙරෙහි ය.

**6.** ඔබ පාසලේ මාධ්‍ය දින උළෙලට සහභාගි වන 400ක් පමණ පිරිස වෙත පිටු දෙකකින් සමන්විත ආරාධිත දේශනයේ පිටපත බැගින් ලබා දීමට වඩාත් උචිත මුද්‍රණ ක්‍රමය වන්නේ,
(1) අංකිත අනුපිටපත්කරණයයි.
(2) ඕෆ්සෙට් මුද්‍රණයයි.
(3) පරිගණක ප්‍රකාශන ක්‍රමයයි(DTP).
(4) තිර මුද්‍රණයයි.

**7.** සිනමා කෘතියක සාර්ථකත්වයේ මූලික පදනම වන්නේ,
(1) තාක්ෂණයේ නූතන බවයි. (2) සංස්කරණයේ සංගත බවයි.
(3) තිර පිටපතේ ගුණාත්මක බවයි. (4) රංග වින්‍යාසයේ සුවිශේෂී බවයි.

**8.** කණ්ඩායම් සන්නිවේදනය පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) නායකයෙක් සිටීමට ඉඩ ඇත. (2) පොදු අරමුණක් තිබීම වැදගත් වේ.
(3) අවම හෝ උපරිම සාමාජික සංඛ්‍යාවක් නොමැත. (4) මුහුණට මුහුණ ලා සිටීම අනවශ්‍ය ය.

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**9.** සිනමා මාධ්‍යයේ නිර්මාණාත්මක ලක්ෂණ වටහාගත හැකි වන්නේ,
(1) සිනමා ශාලාවක් තුළ චිත්‍රපට නැරඹීමෙනි. (2) සංගත තැටි මගින් චිත්‍රපට නැරඹීමෙනි.
(3) රූපවාහිනිය මගින් චිත්‍රපට නැරඹීමෙනි. (4) අන්තර්ජාල මගින් චිත්‍රපට නැරඹීමෙනි.

**10.** පිරිසක් වෙත තොරතුරු ඉදිරිපත් කිරීමේ දී **අවම** කාලයක් තුළ භාවිතයට යොදාගත හැකි වන්නේ,
(1) විනිවිදක ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි. (2) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
(3) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි. (4) චිත්‍රපට ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.

**11.** ගුවන්විදුලි නාට්‍යයකට සවන්දීමේ දී එකී සිදුවීම් පිළිබඳ රූප අප සිත්හි මැවේ. මෙය,
(1) ද්විරූපතාවයි. (2) පරිකල්පනයයි. (3) රූපක භාවිතයයි. (4) ස්ව සංකල්පයයි.

**12.** පුවත්පතක් සඳහා ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී වැදගත්ම තොරතුරු මුලින් ම ඉදිරිපත් කරයි. මෙය,
(1) දෘඪ පුවත් වාර්තාකරණයයි. (2) උඩුකුරු පිරමීඩාකාර ක්‍රමයයි.
(3) මූල පාඨ රචනයයි. (4) ගවේෂණාත්මක වාර්තාකරණයයි.

**13.** ලෝක ව්‍යාප්ත ජාලයේ (World Wide Web) නිර්මාතෘවරයා ලෙස සැලකෙන්නේ,
(1) ටිම් බර්නර්ස් ලී ය. (2) ජෝන් ලොගී බෙයාර්ඩ් ය.
(3) එඩ්වඩ් හාපර් ය. (4) ආතර් සී ක්ලාක් ය.

**14.** පහත විධික්‍රම අතුරෙන් පුද්ගලාන්තර සන්නිවේදනයට ඇතුළත් **නොවීමට** ඉඩ ඇත්තේ කුමක් ද?
(1) ලිපියක් යැවීම (2) විද්‍යුත් තැපැල් ගිණුමක් ඇරඹීම
(3) අතට අත දීම (4) කෙටි පණිවිඩයක් යැවීම

**15.** ආවෘත පරිපථ රූපවාහිනීවල අරමුණ වන්නේ,
(1) සෘජුව නිවෙස් වෙත සේවා සැපයීමයි. (2) අභ්‍යන්තර හා බාහිර පරිසර සුපරීක්ෂණයයි.
(3) දේශීය හා විදේශීය සේවා ලබා දීමයි. (4) පසුගිය වැඩසටහන් නැරඹීමේ පහසුකම් සැපයීමයි.

**16.** ජගත්, පොත් ප්‍රකාශන ආයතනයක සෝදුපත් කියවන්නෙකි. ඔහුගේ ප්‍රධාන කාර්යය වන්නේ,
(1) අත්පිටපත්, ප්‍රකාශනය සඳහා සුදුසු දැයි පරීක්ෂා කර බැලීමයි.
(2) මුද්‍රිත පිටපත් හොඳ මට්ටමක ඇත් දැයි පරීක්ෂා කිරීමයි.
(3) අත්පිටපතට අනුව මුද්‍රිත පිටපත පරීක්ෂා කර බැලීමයි.
(4) මුද්‍රණයට පෙර පිටු සැලසුම් කිරීමයි.

**17.** සිනමා මාධ්‍ය භාවිත කරන්නකුට වඩාත් වැදගත් සිද්ධාන්තය වන්නේ,
(1) දෘෂ්ටියේ අඛණ්ඩතාවයි. (2) දෘෂ්ටි ගෝචරභාවයයි.
(3) දුර දෘෂ්ටිකත්වයයි. (4) ක්ෂේත්‍ර ගැඹුරයි.

**18.** හෙට දිනය ගත කරන ආකාරය කල්පනා කළ කුමාරි, උදෑසන පුස්තකාලයට ගොස් හවස සිය මිතුරියන් සමඟ චිත්‍රපටයක් නැරඹීමට යාමට තීරණය කළා ය. එම තීරණය,
(1) කණ්ඩායම් සන්නිවේදන අවස්ථාවකි. (2) පුද්ගලාන්තර සන්නිවේදන අවස්ථාවකි.
(3) ජනසන්නිවේදන අවස්ථාවකි. (4) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදන අවස්ථාවකි.

**19.** ආයතනික පුවත් හසුනක (newsletter) බොහෝ විට ඇතුළත් වන්නේ,
(1) දීර්ඝ කාලීන වැදගත්කමකින් යුත් ප්‍රතිපත්තිමය ලේඛන ය.
(2) පාලනාධිකාරියේ නියෝග සහිත නිවේදන ය.
(3) ඉලක්ක, ලාභ අලාභ සහිත මූල්‍ය ලේඛන ය.
(4) කෙටි කාලයකට අදාළ තොරතුරු සහ සරල සටහන් ය.

WWW.OLEVELAPI.COM

**20.** සමාජයේ විවිධ සිදුවීම් වඩාත් යථාර්ථවත් ලෙස නිරූපණය වන්නේ,
(1) වෘත්තාන්ත සිනමාවේ දී ය. (2) වාර්තා සිනමාවේ දී ය.
(3) පර්යේෂණාත්මක සිනමාවේ දී ය. (4) නිහඬ සිනමාවේ දී ය.

**21.** ගුවන් යානා අනතුරක් පිළිබඳ තොරතුරු කඩිනමින් වාර්තා කිරීමට සිදුව තිබේ. අදාළ ගුවන් යානයේ වර්ගය නිෂ්පාදන වසර හා ඊට අදාළ තාක්ෂණික තොරතුරු පහසුවෙන් ම සපයාගත හැකිවන්නේ,
(1) ගුවන් යානා සමාගමට ෆැක්ස් පණිවුඩයක් යැවීමෙනි.
(2) ගුවන් යානා පිළිබඳ පොත් විමර්ශනය කිරීමෙනි.
(3) ගුවන් යානා පිළිබඳ විශේෂඥයකුට විද්‍යුත් ලිපියක් යොමු කිරීමෙනි.
(4) ගුවන් යානා සමාගමේ වෙබ් අඩවියට පිවිසීමෙනි.

**22.** **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) කථන සන්නිවේදනය නිර්වාචික විය හැකි ය.
(2) වාචික සන්නිවේදනය කථනය මගින් සිදු කළ නොහැකි ය.
(3) නිර්වාචික සන්නිවේදනය සඳහා හඬ භාවිත කළ හැකි ය.
(4) ලිඛිත සන්නිවේදනය වාචික හෝ නිර්වාචික හෝ විය හැකි ය.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**23.** ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යවල සිදු කරන සංස්කරණ කාර්යයෙන් ලැබිය හැකි වැදගත් ම ප්‍රයෝජනය වන්නේ නිර්මාණයේ,
(1) අර්ථ මතු කර ගත හැකි වීමයි. (2) අවස්ථා සම්බන්ධය පවත්වා ගත හැකි වීමයි.
(3) සංක්ෂිප්ත බව ආරක්ෂා කර ගැනීමයි. (4) අනවශ්‍ය වියදම් අඩු කරගත හැකි වීමයි.

**24.** නිරවද්‍ය තොරතුරු වාර්තා කිරීමේ දී මාධ්‍යවේදියකුට වඩා උචිත මූලාශ්‍රය වන්නේ,
(1) ප්‍රවෘත්ති සාකච්ඡා ය. (2) ප්‍රවෘත්ති නිවේදන ය.
(3) ප්‍රවෘත්ති දිනපොත ය. (4) ප්‍රවෘත්ති ඒජන්සි ය.

**25.** පහත ප්‍රකාශ අතුරෙන් අත්පත්‍රිකා සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) නොමිලේ බෙදාහැරීමක් සිදු කරයි.
(2) ප්‍රමාණයෙන් පෝස්ටරයක් හා සමාන වේ.
(3) දිනයක්, වේලාවක්, ස්ථානයක්, කාර්යයක් මතක් කර දීමට බොහෝ විට යොදා ගනී.
(4) කියවීමෙන් පසු එකතු කර තබා නොගන්නා මුද්‍රිත මාධ්‍යයකි.

**26.** පහත දැක්වෙන්නේ පාසල් මාධ්‍ය සමාජයේ දී සන්නිවේදන ස්වරූපය පිළිබඳ සිසුන් ඉදිරිපත් කරන ලද ප්‍රකාශ කිහිපයකි.
නිලූ : මෙය කෙනකු සමඟ අන්තර් සබඳතාවක් පවත්වද්දී නිරුත්සාහයෙන් සිදුවන සන්නිවේදනයකි.
මධූ : අන්තර් පුද්ගල සම්බන්ධතාවයේ ස්වභාවය පිළිබඳ අර්ථය මෙමගින් වටහාගත හැකි ය.
රාජිනී : මෙය සංස්කෘතිය හා බැඳී පවතින්නකි.
ඉහත ප්‍රකාශ මගින් සාකච්ඡා කෙරෙන සන්නිවේදන ස්වරූපය වන්නේ,
(1) වාචික සන්නිවේදනයයි. (2) නිර්වාචික සන්නිවේදනයයි.
(3) ලිඛිත සන්නිවේදනයයි. (4) කථන සන්නිවේදනයයි.

**27.** "සෑම පුරවැසියකුට ම භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළකිරීමේ නිදහසට හිමිකම් ඇත්තේ ය." මෙම ප්‍රකාශය අඩංගු වන්නේ,
(1) මානව හිමිකම් ප්‍රකාශනයේ ය. (2) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ ය.
(3) ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ය. (4) බුද්ධිමය දේපළ පනතේ ය.

**28.** ප්‍රධාන සන්නිවේදන බාධක වර්ග ලෙස සැලකෙන්නේ,
(1) පාරිසරික බාධක සහ අර්ථ බාධකයි. (2) තාක්ෂණික බාධක සහ මනෝවිද්‍යාත්මක බාධකයි.
(3) අර්ථ බාධක සහ මාධ්‍ය බාධකයි. (4) ශාරීරික බාධක සහ මනෝවිද්‍යාත්මක බාධකයි.

**29.** නිමල් සමඟ ක්‍රිකට් තරගයක් නරඹමින් විමල් ඒ පිළිබඳ කතාබහක නියැළිණි. මෙහි දී,
(1) විමල් සන්නිවේදකයෙක් පමණකි.
(2) නිමල් ග්‍රාහකයෙක් පමණකි.
(3) විමල් සන්නිවේදක හා ග්‍රාහක භූමිකා හුවමාරු කරයි.
(4) විමල් හා නිමල් දෙදෙනා ම සන්නිවේදක හා ග්‍රාහක භූමිකා හුවමාරු කරති.

**30.** රූප සටහන මගින් සිදු කරන සන්නිවේදනය




(1) වාචික මෙන් ම නිර්වාචික වේ.
(2) ලිඛිත, වාචික හා නිර්වාචික වේ.
(3) දෘශ්‍ය, ලිඛිත මෙන් ම වාචික වේ.
(4) වාචික හා නිර්වාචික මෙන් ම ලිඛිත හා දෘශ්‍ය වේ.

**31.** පහත දැක්වෙන්නේ චිත්‍රපට නිෂ්පාදනයට දායකත්වය සපයන විවිධ පුද්ගලයින් හා අවස්ථා අයත් වන කාණ්ඩ තුනකි.
A - අධ්‍යක්ෂවරයා, ආලෝකකරණ ශිල්පී, වේශ නිරූපණ ශිල්පී
B - කථාව, තිර රචනය, තිර රචකයා
C - සංස්කාරක, ග්‍රැෆික් නිර්මාණකරු, හඬ කවන ශිල්පියා
පිළිවෙළින් ඉහත කාණ්ඩ තුන අයත් වන අංශ වනුයේ,
(1) පූර්ව නිෂ්පාදනය, නිෂ්පාදනය හා පසු නිෂ්පාදනයයි.
(2) පූර්ව නිෂ්පාදනය, පසු නිෂ්පාදනය හා නිෂ්පාදනයයි.
(3) පසු නිෂ්පාදනය, නිෂ්පාදනය හා පූර්ව නිෂ්පාදනයයි.
(4) නිෂ්පාදනය, පූර්ව නිෂ්පාදනය හා පසු නිෂ්පාදනයයි.

**32.** ජනමාධ්‍ය හා සම්බන්ධ රාජ්‍ය ආයතනයක් **නොවන්නේ**,
(1) ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමයි. (2) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසමයි.
(3) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයයි. (4) ජාතික චිත්‍රපට සංස්ථාවයි.

**33.** පහත අය අතුරෙන් සැබෑ කණ්ඩායම් සන්නිවේදනය සිදු වීමට ඉඩ ඇත්තේ කවර පිරිස අතර ද?
(1) රෝහල් වාට්ටුවක ප්‍රතිකාර ලබන රෝගීන් (2) දුම්රියපොළට රැස්වන මගීන්
(3) වැඩ වර්ජනයකට සහභාගි වන කම්කරුවන් (4) පුස්තකාලයක පුවත්පත් කියවන පාඨකයන්

[හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**34.** ගුවන් විදුලි ප්‍රවෘත්ති පිටපතක **නොතිබිය** යුතු ලක්ෂණයක් වන්නේ,
(1) විස්තරාත්මක සංඛ්‍යා දත්ත ඇතුළත් කිරීමයි.
(2) කරුණු තහවුරු කිරීමට හඬ කොටස් භාවිත කිරීමයි.
(3) එක් අදහසකට එක් වාක්‍යයක් යොදා ගැනීමයි.
(4) සමාන ව උච්චාරණය වන වචන ආසන්නයේ නොයෙදීමයි.

**35.** තම සහතිකපත් දුර්වර්ණ වෙමින් පවතින බව දුටු ජයනී ඒවා සුරක්ෂිත ව තබා ගැනීමට අවශ්‍ය විධික්‍රම කල්පනා කළා ය. ඒ සඳහා වඩාත් උචිත ක්‍රමය වන්නේ,
(1) ඡායාපිටපත් ලබා ගැනීමයි.
(2) ලැමිනේට් කර තැබීමයි.
(3) ආලෝකයට නිරාවරණය නොකර තැබීමයි.
(4) ඡායාරූපගත කර ඒවා මුද්‍රණය කර ගැනීමයි.

**36.** ප්‍රවෘත්ති පාලනය සඳහා නිසි බලධරයකු පත් කිරීමේ අරමුණ වන්නේ,
(1) ප්‍රවෘත්ති සංස්කාරකට ඉහළින් පුවත්පත් කලාවේදියෙකු පත්කිරීමයි.
(2) තෝරාගත් සමහර ප්‍රවෘත්ති ප්‍රකාශයට පත්කිරීම වැළැක්වීමයි.
(3) මාධ්‍ය අන්තර්ගතය හිමිකරුවන්ගේ බලපෑමට නතුකිරීමයි.
(4) නීතියට පරිබාහිර ක්‍රමයකින් ප්‍රවෘත්ති පාලනය කිරීමයි.

**37.** සන්නිවේදනය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - හඬ සහ වර්ණ සංකේතාත්මක වන නමුත් වචන සංකේත ලෙස නොසැලකේ.
B - ඉඟි සහ ඉරියව් සංකේතාත්මක වන නමුත් අක්ෂි සම්බන්ධතාව සංකේත ලෙස නොසැලකේ.
C - පෙනුම සහ බැල්ම සංකේතාත්මක වන නමුත් ස්පර්ශය සංකේත ලෙස නොසැලකේ.

ඉහත ප්‍රකාශ අතුරෙන්,
(1) A පමණක් සත්‍ය වේ.
(2) A හා B පමණක් සත්‍ය වේ.
(3) A, B හා C යන සියල්ල සත්‍ය වේ.
(4) A, B හා C යන සියල්ල අසත්‍ය වේ.

**38.** ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය යනු,
(1) රජයට අයත් පුවත්පත් ප්‍රකාශන ආයතනයකි.
(2) පුවත්පත් ලියාපදිංචි කරන ආයතනයකි.
(3) පැරණි පුවත්පත් සංරක්ෂණය කරන ආයතනයකි.
(4) පුවත්පත් දැන්වීම් ලබා ගන්නා ආයතනයකි.

**39.** මෑතක දී තිරගත වූ චිත්‍රපටයක් සම්බන්ධයෙන් පන්ති කාමරයේ දී ඉදිරිපත් වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.
රවී : ප්‍රධාන චරිතයේ දෙබස් චිත්‍රපටයේ අවසානයට අතිරේක ශක්තියක් එක්කර තිබුණා.
ගුරු : වෙළෙඳපොළ දර්ශන පසුතලය සැබෑ එකක් මෙන් අපූරුයි.
රියාස් : බොහෝ රූපරාමු චිත්‍රපටයේ සෞන්දර්යාත්මක ගුණය ප්‍රකාශ කරනවා.
තරිඳු : චිත්‍රපටයේ සාර්ථකත්වයේ ගෞරවය එහි සියලු කටයුතු සම්බන්ධීකරණය කළ කණ්ඩායමේ නායකයාට හිමිවිය යුතුයි.

ඉහත ප්‍රකාශ අනුව අදාළ භූමිකාව හෝ වගකීම් දරන ලද පුද්ගල අනුපිළිවෙළ කුමක් ද?
(1) අධ්‍යක්ෂ, තිරරචක, කලා අධ්‍යක්ෂ, කැමරා ශිල්පී
(2) තිරරචක, අධ්‍යක්ෂ, කලා අධ්‍යක්ෂ, කැමරා ශිල්පී
(3) තිරරචක, කැමරා ශිල්පී, කලා අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ
(4) තිරරචක, කලා අධ්‍යක්ෂ, කැමරා ශිල්පී, අධ්‍යක්ෂ

WWW.OLEVELAPI.COM

**40.** පහත වගුවේ දැක්වෙන්නේ කැමරා රූප රාමු හා දර්ශන කිහිපයකි.

| කැමරා රූප | දර්ශනය |
|---|---|
| 1. අති සමීප රූපය | A. පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ පූර්ණ දර්ශනයක් |
| 2. සමීප රූපය | B. පුවත්පතක් කියවන පාඨකයෙක් |
| 3. මධ්‍යම රූපය | C. නිවසක් ඉදිරිපිට නවතා ඇති වාහනයක් |
| 4. දුර රූපය | D. දරුවකුගේ කඳුළු පිරුණු ඇසක් |
| 5. අති දුර රූපය | E. රූපවාහිනී වැඩසටහනක ප්‍රවෘත්ති නිවේදකයෙක් |

ඉහත කැමරා රූප හා දර්ශන අතුරෙන් ගැළපෙන වරණය කුමක් ද?
(1) 1-A, 2-B, 3-C, 4-D, 5-E
(2) 1-D, 2-B, 3-E, 4-A, 5-C
(3) 1-D, 2-B, 3-E, 4-C, 5-A
(4) 1-D, 2-E, 3-B, 4-C, 5-A

* *

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....